# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1965/5 - 2016 මැයි මස 02 වැනි සඳුදා - 2016.05.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත**

40 (1) වගන්තිය යටතේ වන නියෝගය

ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය, චන්දිම වීරක්කොඩි වන මා විසින්, 1963 අංක 05 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත 1961 අංක 28 දරන ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 40(1) වගන්තිය ප්‍රකාර, මා වෙත පවරා ඇති බලතල අනුව, මේ සමග වන උපලේඛනයේ දක්වා ඇති යෝජිත දේපළ පවරා ගැනීම මෙයින් අනුමත කරමි.

චන්දිම වීරක්කොඩි,
ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය.

2016 මැයි මස 02 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිංහල පත්තුවේ සුළු කොටස, මින්නේරිය ග්‍රාමයේ පිහිටි ''පටපිලිකන්ද පහල වත්ත'' නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. බී. අබේකෝන් විසින් මැන සාදන ලද, 1993 ඔක්තෝබර් මස 19 දිනැති, අංක 545 දරන පිඹුරෙහි, ලොට් අංක 1 ලෙස නිරූපණය කොට බෙදා වෙන් කර ඇති ඉඩම් කැබැල්ලට මායිම් ; උතුරට : එච්. ආරොන්සිස්ඤෝ යන අය විසින් උරුමකම් කියනු ලබන ඉඩම ද, නැගෙනහිරට : එච්. ආරොන්සිස්ඤෝ යන අය විසින් උරුමකම් කියනු ලබන ඉඩම ද, දකුණට : මින්නේරිය තැපැල් කාර්යාලය ද සහ බස්නාහිරට : ප්‍රධාන මාර්ගය ද මායිම් වූ පර්චස් විසිහතයි දශම අටයි නවයක (අ: 0 රූ : 0 පර් : 27.89) (හෙක්ටයාර් 0.07054) බිම් ප්‍රමාණයකින් යුක්ත වන ඉඩම වේ.

05 - 465

1A - G 23380 — 08 (2016/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*